# මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය පිළිබඳ සංශ්ලේෂණාත්මක විග්‍රහය-2025

**රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාවට නැංවෙන ආකාරය පිළිබඳව සිදු කෙරෙන අධීක්ෂණය**
**පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය**

## විධායක සාරාංශය

පැෆ්රල් සංවිධානය, මාර්තු 12 ව්‍යාපාරය සමඟ එක්ව, විනිවිදභාවය, වගවීම සහ ප්‍රතිඵල මත පදනම් වූ පාලනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ ස්වාධීන නිරීක්ෂණයක නිරත වේ. 2024 ජනාධිපතිවරණයෙන් සහ මහා මැතිවරණයෙන් අනතුරුව, ධුර කාලයේ පළමු මාස හය තුළ රජයේ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සමඟ කෙතරම් දුරට සමපාත වන්නේද යන්න, මෙකී මුලපිරීම මගින් ඇගයීමට පාත්‍ර විය. මෙම නිරීක්ෂණය උදෙසා කැබිනට් තීරණ, 2025 ජාතික අයවැය, විධායක තීරණ සහ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කළ අතර, ඒ සඳහා මූලධර්ම, නිර්ණායක සහ උපකල්පන සහිත ව්‍යුහගත රාමුවක් උපයෝගී කරගන්නා ලදී. රජය විසින්, එයට මඟ පෙන්වන 'ජාතික ප්‍රතිපත්ති රාමුව' ලෙස සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය නිල වශයෙන් පිළිගෙන ඇති බවත්, එය ක්‍රියාවට නැන්වීම අධීක්ෂණය කිරීම පිණිස අභ්‍යන්තර යාන්ත්‍රණ ස්ථාපිත කොට ඇති බවත් සොයාගැනීම් මගින් පෙන්නුම් කෙරේ. ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතාවන්ට අනුකූලව අයවැය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු ප්‍රගතියක් ලබා තිබුනද, අසම්පූර්ණ වාර්තාකරණය සහ ආයතනික විසිරීම හේතුවෙන්, ප්‍රතිපත්තිමය අභිලාෂයන් මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය වීම තවමත් එක සමාන නොවන මට්ටමක පවතී. මෙම ස්වාධීන අධීක්ෂණ අභ්‍යාසය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය කෙරෙහි ඵලදායී දායකත්වයක් ලබා දෙන අතර, එමඟින් විනිවිදභාවය, වගවීම සහ කාර්යසාධනය මත පදනම් වූ රාජ්‍ය පරිපාලන සංස්කෘතියක් පෝෂණය කෙරේ. මැතිවරණ පොරොන්දු, ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බවට පත්වන බවට සහතික කිරීම සඳහා අඛණ්ඩ මහජන අධීක්ෂණය පවත්වා ගැනීමට පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය කැපවී සිටී.

## 1. හැඳින්වීම


මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් යනු දේශපාලන ක්‍රියාකාරීන් සහ පුරවැසියන් අතර ඇතිවන ප්‍රජාතන්ත්‍රවාදී ගිවිසුමක් වන අතර, එමඟින් රජයක් බලයට පත්වීමෙන් අනතුරුව ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත, ප්‍රතිපත්තිමය දැක්ම, පාලන ප්‍රමුඛතා සහ ප්‍රතිසංස්කරණ සඳහා වන කැපවීම් විදහා දක්වනු ලැබේ. මෙකී පොරොන්දු මැනිය හැකි ක්‍රියාමාර්ග බවට පත් කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී වගවීම, මහජන විශ්වාසය සහ ප්‍රතිපත්තිමය සහසම්බන්ධතාවය පවත්වා ගෙන යාම පිණිස අනිවාර්ය වැදගත්කමක් උසුලයි. මෙම සංශ්ලේෂණාත්මක වාර්තාව මගින් මාර්තු 12 ව්‍යාපාරය හා එක්ව පැෆ්රල් සංවිධානය විසින් සිදු කරන ලද අර්ධ-වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලියේ ඒකාබද්ධ සොයාගැනීම් ඉදිරිපත් කෙරේ. පාර්ශ්වකරුවන් රැසකගේ සහභාගීත්වයෙන් සකස් කරන ලද ව්‍යුහගත අධීක්ෂණ රාමුවක් මත පදනම්ව, කැබිනට් තීරණ, විධායක තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග සහ 2025 ජාතික අයවැය ඔස්සේ සිදුව ඇති සමපාත වීම්, මෙම වාර්තාවෙන් ඇගයීමට ලක් කෙරේ. මෙමඟින්, ලේඛන ලබාගැනීමේ හැකියාව කෙරෙහි බලපෑ පරිපාලනමය වෙන්ස්වීම්, වාර්තාකරණයේ පවතින සීමාවන් සහ අයවැය ආශ්‍රිත ප්‍රමුඛතාවන් පිළිගනිමින්, ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය වඩාත් පුළුල් පාලන සන්දර්භයක් තුළ ස්ථානගත කෙරේ.

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක මත පදනම් වූ අදියර කිහිපයකින් යුත් සාක්ෂි සහිත ක්‍රමවේදයක් අනුගමනය කරයි. මෙහි පළමු අදියරේදී, 'උචිත බව' යන නිර්ණායකය කෙරෙහි ඇගයීමෙහි මූලික අවධානය යොමු කළ අතර, එහිදී මැතිවරණ ප්‍රකාශනයන්හී එන පොරොන්දු, පුරවැසි අවශ්‍යතා සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ කෙතරම් දුරට අනුකූල වේද යන්න පරීක්ෂා කරන ලදී. මෙම අදියරේදී විධායක තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග, කැබිනට් තීරණ සහ අයවැය ප්‍රතිපාදන ඇතුළු ප්‍රධාන යෙදවුම් සහ ක්‍රියාකාරකම්


දර්ශක විශ්ලේෂණය කළ අතර, ඒවා අතිශයින් උචිත, උචිත, අර්ධ වශයෙන් උචිත සහ උචිත නොවන, ලෙස ජාතික වශයෙන් පිළිගත් සංවර්ධන ඇගයීම් මාර්ගෝපදේශවලට අනුකූලව සිව්-වැදෑරුම් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයකට අනුව වර්ග කරන ලදී. දෙවන අදියරේදී, ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුවේ (OECD-DAC) කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව යන නිර්ණායක ඇතුළත් කරමින් මෙම රාමුව පුළුල් කළ අතර, එමගින් ක්‍රියාවට නැංවීමේ කාර්යසාධනය සහ ප්‍රතිඵල පිළිබඳ ගැඹුරු තක්සේරුවකට ඉඩ සලසන ලදී. මෙයට අමාත්‍යාංශ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය (මුල පුරන ලද, ඉටුකෙරෙමින් පවතින/සම්පූර්ණ කළ ආදී වශයෙන්) සේවා සැපයීමේ වැඩිදියුණු කිරීම්, පැනවූ නීති රීති සහ ප්‍රතිලාභීන් වෙත ළඟා වීම අධීක්ෂණය කිරීම ඇතුළත් විය. මෙම අදියරගත ප්‍රවේශය මගින්, ප්‍රතිපත්තිමය අනුකූලතාවය ඇගයීමේ සිට ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මකභාවය සහ බලපෑම කාලානුරූපීව ඇගයීම දක්වා වූ ව්‍යුහගත පරිවර්තනයක් සහතික කරයි.

## 2. පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්

රජයේ ප්‍රධාන දැක්ම වන්නේ: පරිසමාප්ත ජීවිතයක්-සුවපහසු රටක් (ප්‍රජා), ගෞරවනීය ජීවිතයක්-සුරක්ෂිත රටක් සඳහා (සාමාජීය), නවීන ජීවිතයක්-පොහොසත් ජාතියක් (ආර්ථික) සහ අභිමානවත් ජීවිතයක්-නොසැලෙන රටක් (ආණ්ඩුකරණ) සහතික කිරීමයි." මෙකී සිවු වැදෑරුම් මූලික අපේක්ෂාවන් මගින් ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සාක්ෂාත් කර ගැනීම පිණිස මගපෙන්වීමේ මෙහෙයුම් ලෙස ක්‍රියා කරයි (රූපය 1). මෙකී දැක්ම ක්‍රියාවට නැංවීම උදෙසා, පුළුල් ප්‍රතිපත්තිමය ඉලක්ක මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම පිණිස, ව්‍යුහගත රාමුවක් සම්පාදනය කරමින්, උප-ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (ඉලක්ක) 39ක් හඳුනාගෙන තිබේ. විස්තීර්ණ ප්‍රතිපත්ති ලේඛනයක් ලෙස, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සංවර්ධනය ඉලක්ක කරගත් පොරොන්දු 437කින්, ප්‍රතිපත්ති ඉලක්ක කරගත් පොරොන්දු 455කින් සහ සංවර්ධන මෙන්ම ප්‍රතිපත්ති යන අංශ දෙකම ආමන්ත්‍රණය කරන පොරොන්දු 441කින් සමන්විත වේ (රූපය 2)




රූපය 1: එක් එක් මෙහෙයුම්/ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ක්‍රියාකාරකම්




රූපය 2: පොරොන්දු සමඟ අනුකූල වන අදාළත්වයේ ප්‍රතිශතයන්

## 3. ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සඳහාවූ රජයේ ප්‍රයත්නයන්

- ජාතික ප්‍රතිපත්ති රාමුව: රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගෙන ඇති අතර, ඒ අනුව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත තම කාර්යයන් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී තිබේ.


- කාර්යසාධන අධීක්ෂණ චක්‍රලේඛය: ප්‍රගති අධීක්ෂණ රාමුව සහ 2025-2029 උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව, 2025 වර්ෂය සඳහා සිය ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලෙස උපදෙස් දෙමින්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2025-03-24 දිනැතිව PS/B/Circular/03/2025 දරණ චක්‍රලේඛය නිකුත් කරන ලදී.

- අනිවාර්ය වාර්තාකරණය: ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ඇතුළත් කරමින්, සියලුම අමාත්‍යාංශ ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යාංශ කාර්ය සාධන අධීක්ෂණ පද්ධතිය (MPMS) හරහා කාර්තුමය වශයෙන් ප්‍රගතිය වාර්තා කළ යුතුය.
- ආයතනික යාන්ත්‍රණයන්: රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී උපායමාර්ගික තීරණ ගැනීම කඩිනම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය ආයෝජන අධීක්ෂණ සහ ඇගයීම් කමිටුවක් 2024-12-30 දින කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලදී.
- ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණය: කාර්යසාධන වගවීම සහ ප්‍රතිඵල ඉලක්ක කරගත්, ක්‍රියාත්මක කිරීම් ශක්තිමත් කිරීම සඳහා, "ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණ" (RBM) ප්‍රවේශයක් හඳුන්වා දීමට 2025 ඔක්තෝබර් 7 දිනැති කැබිනට් තීරණය මගින් රජය පියවර ගෙන තිබේ.
- ආර්ථික වර්ධන ඉලක්කය: රජය මධ්‍යකාලීන ආර්ථික වර්ධන වේගය සැබෑ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 5% ඉක්මවා ලබා ගැනීම ඉලක්ක කරයි. මෙයට සහාය වීම සඳහා, ප්‍රතිපත්තිමය සාකච්ඡා මෙහෙයවීමට සහ ජාතික ආර්ථික අරමුණු සමඟ සමපාත වීම සහතික කිරීම සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ විශේෂ කමිටුවක් පිහිටුවන ලදී.
- ඵලදායිතාව සහ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන: පාසල්, රජයේ, නිෂ්පාදන සහ සේවා අංශ හරහා 2025/26 සිට ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය ආරම්භ කරන ලදී. මෙම මුලපිරීම, "ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික ව්‍යාපෘතියේ අරමුණු ඉදිරියට ගෙන යාම සඳහාත්, කාර්යක්ෂමතාව, වගවීම සහ ප්‍රතිඵල මත පදනම් වූ කාර්යසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහාත් උපායමාර්ගික මෙවලමක් ලෙස ක්‍රියා කරයි.

# 4. කැබිනට් තීරණවල අදාළත්වය තක්සේරු කිරීම

පළමු අදියර (2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා) සහ දෙවන අදියර (2025 ජූනි සිට දෙසැම්බර් දක්වා)

| විස්තරය | පළමු අදියර | දෙවන අදියර |
|---|---|---|
| තීරණ කැබිනට් තීරණ සංඛ්‍යාව | 299 | 457 |
| ව්‍යවස්ථාපිත තීරණ (ඉවත් කරන ලද) | 65 | 27 |
| සමාලෝචනය සඳහා ඉතිරි වූ තීරණ | 234 | 430 |
| තවදුරටත් ඉවත් කිරීම් (නව/පැරණි යෝජනා) | 18 | 00 |
| තක්සේරු කරන ලද මුළු තීරණ සංඛ්‍යාව | 216 | 430 |




රූපය 3: පොරොන්දු වලට අදාළත්වයේ පෙළගැස්මේ ප්‍රතිශතයන්

# 5. විධායක තීරණ

මෙහි පළමු අදියරට අයත් අධීක්ෂණ ක්‍රියාවලිය මගින්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි එන පොරොන්දු සමඟ අනුකූලතාවක් පෙන්නුම් කරන විධායක තීරණ නවයක් (09) හඳුනාගෙන තිබේ. මැතිවරණ පොරොන්දු විධිමත් විධායක ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කිරීම සඳහා ගනු ලැබූ මූලික පියවර මෙයින් පිළිබිඹු වේ. මෙම තීරණ මගින් රජය සිය ප්‍රකාශිත ප්‍රමුඛතාවන් ඉටු කිරීමේදී අනුගමනය කරන ලද මුල්කාලීන ප්‍රතිපත්තිමය දිශානතිය පෙන්නුම් කරයි.

- විද්‍යාත්මකව වෙන්කරන ලද අමාත්‍යාංශ 25කට ඇමතිවරුන් 25ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධූර අහෝසි කිරීම (පිටුව 195): පොරොන්දුව අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත (ඇතැම් ව්‍යතිරේක සහිතව).
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05 කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම (පිටුව 195): පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත.
- මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට: පොරොන්දුව අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇති අතර තහවුරු කිරීම අවශ්‍ය වේ.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම (පිටුව 195): පොරොන්දුව තවමත් ක්‍රියාත්මක කර නොමැත.
- ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම (පිටුව 195): පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත.
- විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම (පිටුව 195): පොරොන්දුව තවමත් ක්‍රියාත්මක කර නැත.
- විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත්කිරීම (පිටුව 195): පොරොන්දුව තවමත් ක්‍රියාත්මක කර නැත.
- අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ධූර කාලය තුළදී එක් වාහනයක් පමණක් ලබාදීම (පිටුව 195): වැඩිදුර තහවුරු කිරීම් අවශ්‍ය වේ.
- 2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශවලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට එරෙහිව කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම: පොරොන්දුව ඉටු කිරීම ආරම්භ කර ඇත.

# 6. පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග

2024 නොවැම්බර් මස, ජාතික ජන බලවේග රජය බලයට පත්වීමෙන් අනතුරුව, වසර 2026 දෙසැම්බර් දක්වා කාලය තුළ මූලික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රමුඛතාවන් සහ ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා පදනම සපයමින්, පාර්ලිමේන්තුව විසින් පනත් 26ක් සම්මත කොට තිබේ. මෙම ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග ප්‍රධාන පාලන ක්ෂේත්‍ර හරහා, ප්‍රතිපත්තිමය පොරොන්දු ඉදිරියට ගෙන යාම පිණිස අත්‍යවශ්‍ය නීතිමය පදනමක් ලෙස ක්‍රියා කරයි. සම්මත කරන ලද පනත් මගින් අවධාරණය කළ කරුණු අතර:

- රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ - පරිපාලන කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම.
- දූෂණ විරෝධී ක්‍රියාමාර්ග - වගවීම සඳහා වන නීතිමය මෙවලම් සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.
- ආර්ථික හා මූල්‍ය පාලනය - අයවැය ක්‍රියාත්මක කිරීම, ආර්ථික කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා සහය වීම.
- සමාජ ආරක්ෂණය සහ සුබසාධනය - ප්‍රජා යහපැවැත්ම සඳහා වන පරිපාලනමය රාමු ශක්තිමත් කිරීම.
- නියාමන සහ ආයතනික සංවර්ධනය - වඩා හොඳ සේවා සැපයීම සඳහා පාලන ව්‍යුහයන් නවීකරණය කිරීම.

ව්‍යවස්ථාපිත රාමු රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පොරොන්දු සමඟ සමපාත කිරීමටත්, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහ ඒවායේ තිරසාරභාවය සහතික කිරීමටත් දරන පුළුල් උත්සාහය මෙකී ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග මගින් පිළිබිඹු වේ.

| පනත් අංකය | නාමය | සම්මත වූ දිනය | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව |
|---|---|---|---|
| 01/2025 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත | 17.02.2025 | දැනට දින නියමයක් නොමැතිව කල් දමා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ, ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම පිණිස වසරක් ඇතුළත පැවැත්වීම. |
| 02/2025 | දේශීය ආදායම් (සංශෝධන) පනත | 20.03.2025 | ▪ උපයන විට ගෙවීමේ බද්ද සංශෝධනය කිරීම.<br>▪ පුද්ගලික ආදායම් බදු සඳහා වන වාර්ෂික බදු සීමාව රුපියල් මිලියන 1.2 සිට මිලියන 2.4 දක්වා වැඩි කිරීම සහ සාධාරණ පදනමක් මත බදු අනුපාත සහ බදු කාණ්ඩ සංශෝධනය කිරීම. |
| 03/2025 | විසර්ජන පනත | 21.03.2025 | ජාතික අයවැය සඳහා වන ව්‍යවස්ථාපිත අධිකාරිය |
| 04/2025 | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 09-11.04.2025 | බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කිරීම. |
| 05/2025 | අපරාධයකින් උත්පාදිත දේ. පිළිබඳ පනත | 08-30.04.2025 | දූෂණය සහ මූල්‍ය අපරාධ වැළැක්වීම සඳහා වන නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම. |
| 06/2025 | විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත | 23.05.2025 | ණය තිරසාරභාවය පවත්වා ගැනීම සහ ණය පොළිය දරාගත හැකි මට්ටමක තබා ගැනීම අරමුණු කරගනිමින්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතුවලදී අවශ්‍ය පරිදි භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසාර විශ්ලේෂණයක් (DSA) සකස් කිරීම. |
| 07/2025 | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | 04-18.06.2025 | රක්ෂිත බන්ධනාගාරගතව සිටින සිරකරුවන් ලෙස දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම වැළැක්වීම සඳහා අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. |
| 08/2025 | ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත | 05-19.06.2025 | ත්‍රිරෝද රථ සේවා, කාර්ය මණ්ඩල ප්‍රවාහන සහ පාසල් ප්‍රවාහන සේවා ඇතුළු කුලී රථ සේවාවන්හි ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා විධිමත් කිරීම. |
| 09/2025 | සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත | 22-23.07.2025 | මැන් පවර් සේවකයින් සඳහා සාධාරණ වැටුප් සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම (වැටුප් ව්‍යුහය). |
| 10/2025 | සේවකයන්ගේ අයවැය සහන දීමනා (දෙවන) පනත | 22-23.07.2025 | මැන් පවර් සේවකයින් සඳහා සාධාරණ වැටුප් සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම (වැටුප් ව්‍යුහය). |
| 11/2025 | සේවකයන්ගේ ජාතික අවම වේතන (සංශෝධන) පනත | 22-23.07.2025 | වැටුප් විෂමතා අවම කරන සහ සේවකයින් දිරිමත් කරන ජාතික වැටුප් ව්‍යුහයක් ස්ථාපිත කිරීම. |
| 12/2025 | සමාගම් (සංශෝධන) පනත | 24.07-04.08.2025 | ▪ මූල්‍ය අවභාවිතය, අල්ලස, දූෂණය වැනි දූෂිත ක්‍රියා වැළැක්වීම සඳහා ව්‍යවස්ථාපිත ප්‍රමුඛතාවය ලබා දීම.<br>▪ දූෂණය සහ මූල්‍ය අපරාධ වැළැක්වීම සඳහා නීති සහ අනෙකුත් ව්‍යුහයන් සවිබල ගැන්වීම සහ විධිමත් කිරීම. |
| 13/2025 | විනිමය පත්‍ර (සංශෝධන) පනත | 07-15.08.2025 | මූල්‍ය අවභාවිතය, අල්ලස, දූෂණය වැනි දූෂිත ක්‍රියා වැළැක්වීම සඳහා ව්‍යවස්ථාපිත ප්‍රමුඛතාවය ලබා දීම . |
| 14/2025 | ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත | 06-18.08.2025 | තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, තෙල් මත පදනම් වූ උත්පාදනය මත යැපීම අවම කිරීමේ අරමුණින් සූර්ය සහ සුළං බලශක්ති ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය ලබා දීම හරහා වසර පහක් ඇතුළත විදුලි මිල ක්‍රමයෙන් කලාපයේ අඩුම මට්ටම දක්වා රැගෙන එම. |

| | | | |
|---|---|---|---|
| 15/2025 | සමෘද්ධි (සංශෝධන) පනත | 20-22.08.2025 | සමෘද්ධි බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඇතුළු සමුපකාර බැංකු පද්ධතිය ශක්තිමත් කිරීම මගින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය ආධාර ඉහළ නැංවීම. |
| 16/2025 | රබර් පාලන (සංශෝධන) පනත | 20-22.08.2025 | තේ, රබර් සහ පොල් වැනි බහු වාර්ෂික බෝගවල අතුරු බෝග වගාව සහ විවිධාංගීකරණය සඳහා තාක්ෂණික, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් සැලසීම. |
| 17/2025 | සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත | 19.08-03.09.2025 | අවිධිමත් අංශයේ සංචාරක ක්‍රියාකරුවන් විධිමත් අංශයට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම. |
| 18/2025 | ජනාධිපතිවරුන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත | 10.09.2025 | විශ්‍රාමික ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ලබා දෙන විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම. |
| 19/2025 | ජාතික විගණන (සංශෝධන) පනත | 11-22.09.2025 | රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම, දූෂණයට එරෙහිව සටන් කිරීම සහ මූල්‍ය පාලනය ඉහළ නැංවීම. |
| 21/2025 | ක්‍රීඩා වල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත | 07.10.2025 | ▪ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය, තරඟ පාවාදීම් සහ අනෙකුත් විෂමාචාර ඇතුළු සියලු ආකාරයේ වංචා සහ දූෂණ තුරන් කිරීම සඳහා යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම. පවතින චර්යාධර්ම පද්ධති සහ ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීම. |
| 22/2025 | පුද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත | 21-30.10.2025 | නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීමට, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සුරැකීමට සහ දත්ත රහස්‍යභාවය, ආරක්ෂාව සහ සයිබර් ආරක්ෂණය සහතික කෙරෙන විස්තීර්ණ නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම. |
| 23/2025 | විසර්ජන පනත (දෙවන) | 05.12.2025 | ජාතික අයවැය සඳහා වන ව්‍යවස්ථාපිත අධිකාරිය. |
| 24/2025 | සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | 05-17.12.2025 | බදු ව්‍යුහය විධිමත් කිරීමේ අරමුණින් නිදහස් කිරීම් සඳහා සංශෝධන හඳුන්වා දීම සහ බදු අය කළ හැකි සේවාවන්හි විෂය පථය පැහැදිලි කිරීම. |
| 25/2025 | ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත | 05-17.12.2025 | බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කිරීම. |
| 26/2025 | ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත | 05-17.12.2025 | උපරිම බදු සහන කාලය වසර 25 සිට 10 දක්වා අඩු කිරීම, අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සහ උපායමාර්ගික ආයෝජන සඳහා දැඩි අනුකූල වීමේ අවශ්‍යතා පැනවීම. |

# 7. ජාතික අයවැය 2025/2026 සහ යෝජනා

අධීක්ෂණයේ පළමු අදියර, 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා වූ සීමිත කාලසීමාව සැළකිල්ලට ගනිමින්, මූලික වශයෙන් ප්‍රතිදානයන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙහි දෙවන අදියර මඟින් 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය ආවරණය වන අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පොරොන්දු ක්‍රියාත්මක ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමේදී අමාත්‍යාංශවල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට අපේක්ෂා කෙරේ. දෙවන අදියරේදී, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම් හරහා සියලුම අමාත්‍යාංශ වෙතින් ප්‍රගති වාර්තා ලබා ගැනීම අධීක්ෂණ කණ්ඩායමේ මූලික අරමුණ විය. කෙසේ වුවද, ලේඛන ලැබී පැවතියේ අමාත්‍යාංශ 25ක් අතුරින් 15ක් වෙතින් පමණි. එසේ වුවද, පවතින සියලුම ලේඛන උපරිම වශයෙන් භාවිත කරමින් ලුහුබැඳීම සහ විශ්ලේෂණය සිදු කරන ලදී. 2025 මාර්තු මස ගනු ලැබූ කැබිනට් තීරණයක් ප්‍රකාරව රජය විසින් සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් පිළිගනු ලැබිණි. ඒ අනුව, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වූ පොරොන්දු 1,333ක් ක්‍රියාකාරකම් 1,385ක් ලෙස පරිවර්තනය කොට, පසුව අමාත්‍යාංශ 25ක් අතර ක්‍රියාකාරකම් 1,474ක් ලෙස බෙදා හරිනු ලැබ ඇත. ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම පහසු කිරීම සඳහා සීමිත ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් අමාත්‍යාංශ එකකට වඩා වැඩි ගණනකට පවරා ඇත. 2025 ජාතික අයවැය මඟින් ව්‍යාපෘති සහ වැඩසටහන් 1,357ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කොට තිබේ. ඒ අනුව, සෑම අමාත්‍යාංශයක්ම පහත සඳහන් පරිදි අධීක්ෂණය කර ඇත:

අ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු විශ්ලේෂණය

ආ. ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගත හැකි බව

ඇ. අමාත්‍යාංශ මට්ටමේ කැබිනට් තීරණ විශ්ලේෂණය

ඈ. අමාත්‍යාංශ අයවැය සහ ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම

ඉ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග

ඊ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාවට නැංවීමේ මාවත

අයවැය ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් සංවර්ධන වියදම්වලට වඩා පුනරාවර්තන වියදම් සඳහා (ණය ආපසු ගෙවීම් හැර) වෙන් කර ඇති බව අධීක්ෂණ ක්‍රියාවලියේදී හඳුනා ගනු ලැබිණි. අයවැය ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් සංවර්ධන වියදම්වලට වඩා පුනරාවර්තන වියදම් සඳහා (ණය ආපසු ගෙවීම් හැර) වෙන් කර ඇති බව නිරීක්ෂණ ක්‍රියාවලියේදී හඳුනා ගනු ලැබිණි. මෙයින් ඇඟවෙනුයේ සංවර්ධන මැදිහත්වීම්වලට වඩා මෙහෙයුම් කටයුතු කෙරෙහි අමාත්‍යාංශ වැඩි අවධානයක් යොමු කරන බවයි.

| වර්ෂය | සමස්ථ ප්‍රතිපාදනය (රු. මිලියන) | පුනරාවර්තන (රු. මිලියන) | % | ප්‍රාග්ධන (රු.මිලියන) | % |
|---|---|---|---|---|---|
| 2025 | 6,637,463 | 5,410,996 | 81.5% | 1,226,467 | 18.5% |

ණය ආපසු ගෙවීම සැලකිය යුතු මූල්‍යමය වැය බරක් වන අතර, 2025 වසර සඳහා ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,600,000ක් වෙන් කර ඇත.

| වර්ෂය | සමස්ථ ප්‍රතිපාදනය (රු. මිලියන) | පුනරාවර්තන (රු. මිලියන) | % | ප්‍රාග්ධන (රු.මිලියන) | % |
|---|---|---|---|---|---|
| 2025 | 8,835,001 | 0 | 0% | 1,600,000 | 18.1% |

2025 ජාතික අයවැය සන්දර්භය තුළ, මූලික අයවැය ඉදිරිපත් කිරීම සඳහා වූ තුන් මසක ප්‍රමාදය, නව රජයක් පිහිටුවීම හා සම්බන්ධ සංක්‍රාන්ති කාලය හේතුවෙන් ඇති වූ බාධාවක් ලෙස සැළකිය හැකිය. තවද, සිව්වන කාර්තුවේ ඇති වූ සුළි කුණාටු ව්‍යසන තත්තවය හේතුවෙන් ඇති වූ බාධාවන්, අමාත්‍යාංශවල දෛනික වැඩ කටයුතුවලට මෙන් ම පරිපාලන ක්‍රියාවලීන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. මෙකී සාධක කාලීන කාර්යක්ෂමතාව සහ ආයතනයන්ගේ කළමනාකරණ ධාරිතාව පිළිබඳ ගැටළු මතු කරයි.

# 8. ප්‍රමුඛ වැඩසටහන් සහ මුලපිරීම්

## "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යනු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමාවන් කිහිපයක් උපායමාර්ගික ලෙස ක්‍රියාවට නැංවීමක් වන අතර, විශේෂයෙන් සමාජීය වශයෙන් දැනුවත්, පාරිසරික වශයෙන් වගකිවයුතු සහ සදාචාරාත්මක පදනමක් සහිත සමාජයක් ගොඩනැගීමේ සමස්ථ දැක්ම යටතේ මෙය ක්‍රියාත්මක වේ. පළමු වසර තුළ, මෙකී මුලපිරීම සංකේතාත්මක ප්‍රචාරක ව්‍යාපාරවලින් ඔබ්බට ගොස් පාසල්, රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතුළු ව්‍යුහගත ආයතනික ඒකාබද්ධතාවයක් කරා ගමන් කොට තිබේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුලත් පහත සඳහන් පොරොන්දු සම්බන්ධයෙන් මෙම විශේෂිත වැඩසටහනට අනුකූලව කැබිනට් තීරණ ලබා ගෙන ඇති බව පළමු අදියරේදී  අධීක්ෂණයට ලක් විය:

- වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සහ අදාළ ප්‍රතිපත්ති සමාලෝචනය කරමින් ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

- අවශ්‍ය සම්පත් සහ තාක්ෂණික පහසුකම් සැලසීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන සංශෝධනය යටතේ පිළිගෙන ඇති ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

ප්‍රතිඵල මට්ටමේ පාරිසරික බලපෑම් දත්ත සීමිතව පැවතියද, වගවීමේ යාන්ත්‍රණයන් ආයතනික මට්ටමෙන් ස්ථාපිත කිරීම මගින් ප්‍රතිපත්තිමය අභිලාෂයක සිට ව්‍යුහගත වශයෙන් ක්‍රියාවට නැංවීම දක්වා ඉදිරියට ගොස් ඇති බව පෙන්නුම් කරයි.

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව  දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම

දූෂණ විරෝධී ආණ්ඩුකරණය සවිමත් කිරීමට රජය විසින් දී ඇති පොරොන්දුවට අනුකූලව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) ආයතනික ධාරිතාව සහ ව්‍යවස්ථාපිත රාමුව ශක්තිමත් කිරීමේ ප්‍රගතියක් දක්නට ලැබේ. දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස් කරන ලද, නව ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) සඳහා 2025 මාර්තු 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. කෙසේ වුවද, බලාත්මක කිරීමේ ක්‍රියාවලීන් තීව්‍ර ඇති අතර, එහි දිගුකාලීන බලපෑම් පිළිබඳ තක්සේරුව වැරදිකරුවන් කිරීමේ අනුපාතය, වත්කම් අයකර ගැනීමේ ප්‍රතිඵල සහ දූෂණය පිටු දැකීමේ පද්ධතිමය ප්‍රතිසංස්කරණ මත රඳා පවතිනු ඇත.

## ප්‍රජාශක්ති

ප්‍රජාශක්ති වැඩසටහන මගින් සහභාගීත්ව පාලනය සහ පුරවැසියා කේන්ද්‍ර කරගත් සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති අවධාරණයන් පිළිබිඹු වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ (පිටුව, 39) හි සඳහන් වන පරිදි මෙය අඩු ආදායම්ලාභීන් සඳහා වූ දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහනකි. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව 'පොහොසත් රටක් - සුරක්ෂිත ජීවිතයක්' යන දැක්ම සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි බහුවිධ ප්‍රවේශයක් සහිත ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ප්‍රජාශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබේ. මෙම වැඩසටහන 2025 ජූලි මස දියත් කරන ලදී. ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට සහ ඉදිරි කටයුතු සැලසුම් කිරීම පිණිස රජයේ බලධාරීන් දිස්ත්‍රික් ලේකම්වරුන් සහ නිලධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඇත. ගම්මාන සංවර්ධන සැලසුම්කරණය සඳහා සහය වීම පිණිස නව ඩිජිටල් පද්ධතියක් හඳුන්වා දී ඇති අතර, එමගින් ප්‍රජා සංවර්ධන සභාවලට (CDCs) ඒකාබද්ධ සැලසුම් සකස් කිරීමට, ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සහ තාක්ෂණය භාවිතයෙන් ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට ඉඩ සැලසේ.  ජනාධිපති මාධ්‍ය අංශයට අනුව, මෙම වැඩසටහන යටතේ රජය දිවයින පුරා පිහිටි සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රුපියල් මිලියන 01 බැගින් වෙන් කොට තිබේ.  තවමත් මුල් අවධියේ පසුවුවද, මෙම මුලපිරීම තීරණ ගැනීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීමට සහ වගවීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටම කරා යොමු වීමට ඉවහල්වන බවක් පෙන්නුම් කරයි. එහි ඵලදායීතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සේවා සැපයීමේ වැඩිදියුණු කිරීම් සහ පුරවැසි දුක්ග ැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් සම්බන්ධව මැනිය හැකි දර්ශක පැවතීම අවශ්‍ය වේ.

## රටම එකට: විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ජාතික වැඩපිළිවෙල

2025 ඔක්තෝබර් මස දියත් කරන ලද රජයේ ඒකාබද්ධ මත්ද්‍රව්‍ය විරෝධී උපායමාර්ගය, ආරක්ෂිත සමාජයක් සහතික කිරීම සඳහා වන එහි කැපවීම සමඟ සමපාත වේ. මෙම වැඩසටහනේ ප්‍රගතිය පිණිස ආයතන අතර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, පුනරුත්ථාපන මාර්ග පුළුල් කිරීම සහ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් තීව්‍ර කිරීම ඇතුළත් විය. 'එක්ව ජයගමු ජාතික මෙහෙවර' හඳිසි හා කඩිනම් ජාතික වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමටත් ඒ සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමටත් කැබිනට් අනුමැතිය ලබා දී තිබේ. මෙය ජනාධිපතිවරයාගේ අනුශාසකත්වය යටතේ සිදු කෙරෙන අතර, දිස්ත්‍රික් මට්ටමේ මැදිහත්වීම්, මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් සහ නීතිය බලාත්මක කරන ආයතන සහ පරිපාලන බලධාරීන් අතර සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ඇතුළත් රටපුරා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ජාතික වැඩසටහනේ කොටසක් ලෙස ජනාධිපතිවරයා සිදු කරන දිස්ත්‍රික් සංචාරයන් මඟින් ඉහළ මට්ටමේ දේශපාලන කැපවීමක් පෙන්නුම් කරන අතර මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් ඒකාබද්ධ ජාතික ප්‍රතිචාරයක අරමුණ සවිමත් කරයි.

# 9. පළමු වසර තුළ පොරොන්දු ඉටු කර ගැනීමේ ජයග්‍රහණ

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | ගනු ලැබූ ක්‍රියාමාර්ගය/ක්‍රියාමාර්ග | ඉටු කිරීමට අදාළ තත්ත්වය |
|---|---|---|---|
| 01 | විද්‍යාත්මකව වෙන් කරන ලද අමාත්‍යාංශ 25 කට ඇමතිවරුන් 25 ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධුර අහෝසි කිරීම (පිටුව, 195) | කැබිනට් මණ්ඩලය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් 25කට සීමා කිරීමේ පොරොන්දුව විධායකය හරහා ක්‍රියාත්මක කර ඇත.<br><br>කෙසේ වුවද, කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව 22ක් වන අතර නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව 28 කි. අමාත්‍යවරුන් සංඛ්‍යාව 25ක් දක්වා සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව 32ක් දක්වා වැඩි වීම හේතුවෙන් පොරොන්දුව උල්ලංඝනය වී තිබේ. | ක්‍රියාත්මක කොට තිබේ<br><br>උල්ලංඝනය කර ඇත |
| 02 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05 කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම (පිටුව, 195) | කැබිනට් අනුමැතිය හිමි විය (වාර්තාකරණ කාලසීමාව තුළ) සහ විශ්‍රාම වැටුප අවලංගු කිරීමේ පනත සම්මත කරන ලදී (නිරීක්ෂණ කාලසීමාවෙන් අනතුරුව). | ක්‍රියාත්මක කොට තිබේ |
| 03 | මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට (පිටුව, 195) | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අලුතින් වාහන බලපත්‍ර නිකුත් කොට නැත. කෙසේ වුවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වාහන භාවිතා කරන ක්‍රමවේදය තවමත් අපැහැදිලි වන අතර 2026 ජාතික අයවැය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු පිරිස් සඳහා වාහන ආනයනයට ප්‍රතිපාදන වෙන් කොට තිබේ. | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කොට තිබේ (තහවුරු කිරීමට අවශ්‍ය වේ) |
| 04 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම (පිටුව, 195) | මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| 05 | ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම (පිටුව, 195) | 2025 අංක 18 දරණ ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත මගින් හිටපු ශ්‍රී ලංකා ජනාධිපතිවරුන් සඳහා රජයෙන් ලබා දෙන නිවාස සහ බොහෝ වරප්‍රසාද අහෝසි කරයි. | ක්‍රියාත්මක කොට තිබේ |
| 06 | ජනතාවට ලබා දිය යුතු හඳුනාගත් සේවාවන් රාශියක් ' එකම වහලක් යටින්' සංකල්පය මත, ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ඉටුකර දීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් තුළ පහසුකම් ඇති කිරීම (පිටුව, 199) | 2025 පෙබරවාරි 7 වන දින නව ඩිජිටල් මුලපිරීම් තුනක් හඳුන්වා දෙන ලදී. | ආරම්භ කොට තිබේ |
| 07 | රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Directorate of Public Prosecution) පිහිටුවීම (පිටුව, 203) | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මේ පිළිබඳ සැලසුම් ප්‍රකාශයට පත් කර ඇති අතර කැබිනට් අනුමැතිය ද හිමිව තිබේ. එසේ වුවද, තවමත් ස්ථාපිත කොට නැත. | ආරම්භ කොට තිබේ |
| 08 | විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම (පිටුව, 195) | හිටපු ජනාධිපතිවරුන්ගේ පෞද්ගලික විශ්‍රාම වැටුප් එලෙසම පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36(2) ව්‍යවස්ථාව මගින් එකී විශ්‍රාම වැටුප් ආරක්ෂා වී ඇති බැවින්, ඒවා වෙනස් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වේ. | ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| 09 | විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කිරීම (පිටුව, 195) | මෙය අවසාන විධායක ජනාධිපති ධුරය වනු ඇති බවට රජය පාර්ලිමේන්තුව තුළ සහ ඉන් පිටත ප්‍රසිද්ධියේ අවධාරණය කර ඇත. කෙසේ වුවද, එය අහෝසි කිරීම සඳහා නිල කාලරාමුවක් මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැත. | ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| 10 | අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ධුර කාලය තුළදී එක් වාහනයක් පමණක් ලබාදීම (පිටුව, 195) | මේ පිළිබඳ කිසිදු යාවත්කාලීන කිරීමක් හෝ තොරතුරක් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට නොමැත. අමාත්‍යාංශ 25ක් වෙත තොරතුරු දැනගැනීමේ (RTI) අයදුම්පත් ඉදිරිපත් කළ අතර ප්‍රතිචාර ලැබුණේ අමාත්‍යාංශ 13ක් වෙතින් පමණි. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |
| 11 | 2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශ වලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම (පිටුව, 207) | පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිසම් සභා වාර්තාව ජනාධිපති නියෝගයක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) භාර දී ඇති අතර අධිකරණයේ විමර්ශන කඩිනම් කරමින් දෛනික නඩු විභාග පැවැත්වේ. | ආරම්භ කොට තිබේ |

| | | | |
|---|---|---|---|
| 12 | දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (පිටුව 227) | 2025 අප්‍රේල් 30 වන දින 2025 අංක 5 දරණ අපරාධයකින් උත්පාදිත. දේ පිළිබඳ පනත පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 13 | බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (පිටුව, 103) | කැබිනට් අනුමැතිය හිමි විය. 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කර, 2025 අංක 4 දරණ එකතු කළ අගය මත බදු(සංශෝධන) ... පනත 2025 අප්‍රේල් 11 දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 14 | පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24 දක්වා වැඩි කිරීමට සහ බදු කාණ්ඩ (Tax Brackets) හා බදු අනුපාත (Tax Rates) සාධාරණ ලෙස සංශෝධනය කිරීම (පිටුව, 104) | කැබිනට් අනුමැතිය හිමි විය. 2025 අංක 2 දරණ දේශීය ආදායම් පනත 2025 මාර්තු 20 දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. මිලියන 2.4 ක බදු සීමාවක් පොරොන්දුව පැවතියද, සංශෝධනය මගින් ඉහළ නංවා තිබුනේ මිලියන 1.8ක් දක්වා පමණි. | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කොට තිබේ |
| 15 | දැනට දින නියමක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලැසීම (පිටුව, 231) | 2025 පෙබරවාරි 17 දින 2025 අංක 1 දරණ පළාත් පාලන ආයතන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත සහතික කරන ලදී. 2025 මැයි මාසයේදී පළාත් පාලන මැතිවරණය පවත්වන ලදී. පළාත් සභා මැතිවරණය වසරක් ඇතුළත පැවැත්වීම පිළිබඳ නිල නිවේදනයක් තවමත් අපේක්ෂා කෙරේ. ඒ සඳහා අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මැතිවරණ ක්‍රමය සහ සීමා නිර්ණය පිළිබඳ සාකච්ඡා කිරීමට කමිටුවක් පත් කර ඇත. | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කොට තිබේ |
| 16 | සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වා ගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක් (පිටුව, 62) | ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමේ පනත් කෙටුම්පතකට කැබිනට් අනුමැතිය හිමි විය. ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් නියාමනය සහ වගවීම කෙරෙහි අවධානය යොමු කරන ස්වාධීන මාධ්‍ය කොමිසමක් ඉල්ලා සිටියද, වරලත් ආයතනය යනු මාධ්‍යවේදීන් ප්‍රමිතිකරණය කිරීම සඳහා වූ වෘත්තීය ආයතනයකි. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |
| 17 | ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරඟකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීමේ ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (පිටුව, 166) | 2025 අගෝස්තු 15 දින ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේදී සම්මත විය. ලංවිම ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගෙන තිබුණද, 2025 ජූනි 12 දින මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය මත විදුලි ගාස්තු 15%කින් වැඩි කරන ලදී. | ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| 18 | ත්‍රීරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම (පිටුව, 175) | ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත 2026 ජූනි 19 වන දින සම්මත කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 19 | රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම (පිටුව, 210) | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත 2025 ජූනි 18 වන දින සම්මත කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 20 | නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (පිටුව, 155) | පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත 2025 ඔක්තෝබර් 30 වන දින සම්මත කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 21 | කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාස වල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස (පිටුව 32) | චීන රජයේ ආධාර යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම (ජාතික අයවැය 2025). | ආරම්භ කොට තිබේ |
| 22 | ආර්තව දරිද්‍රතාව (Period Poverty) අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදීම (පිටුව, 78) | පාසල් ශිෂ්‍යාවන් 80,000කට සනීපාරක්ෂක තුවා ලබා දීම සඳහා ජාතික අයවැයෙන් රුපියල් මිලියන 1440ක් වෙන් කර ඇත. | ක්‍රියාත්මක කොට තිබේ |
| 23 | ප්‍රකාශනයේ නිදහසට බාධා වන වගන්තීන් ඉවත්කොට 2024 අංක 09 දරන මාර්ග ගත ක්‍රම වල සුරක්ෂිතතාව පිළිබඳ පනත සංශෝධනය කිරීම පිටුව, (61) | කමිටුවක් පත් කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය.<br>රවී කරුණානායක මන්ත්‍රීවරයා විසින් මෙම පනත අහෝසි කිරීමට පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කොට තිබේ (2025 අප්‍රේල්)<br>හර්ෂණ රාජකරුණා මන්ත්‍රීවරයා විසින් පනත සංශෝධනය කිරීමට පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කොට තිබේ (2026 පෙබරවාරි). | ආරම්භ කොට තිබේ |

| | | | |
|---|---|---|---|
| 24 | ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා 5%ක වැඩි පොලී ප්‍රතිශතයක් (පිටුව, 67) | 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 25,000ක් වෙන් කරන ලදී. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ස්ථාවර තැන්පතු ක්‍රමය 3%කින් ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය. නමුත් පොරොන්දුව වූයේ 5%කි. | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කොට තිබේ |
| 25 | රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා අවම කරන හා සේවකයා දිරිගන්වන ජාතික වැටුප් ව්‍යුහයක් (පිටුව, 72) | සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත 2025 ජූලි 23 දින සම්මත විය.<br>මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා, 2005 සහ 2016 අයවැය මගින් වෙන් කරන ලද අයවැය සහන දීමනා ලබා දුන් 2025 අංක 10 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත සහ 2025 අංක 9 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත අවලංගු කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 26 | ඩිජිටල්කරණය, කාර්ය සාධන කළමනාකරණය, සහ පුරවැසි නියැලීම යන සංකල්පයන් සැලකිල්ලට ගනිමින් වත්මන් රාජ්‍ය කළමනාකරණය නව රාජ්‍ය කළමනාකරණ ක්‍රම දක්වා පරිවර්තනය කිරීම (පිටුව, 198) | ශ්‍රී ලංකා මහ බැංකුවේ නව සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති ඒකාබද්ධ කරන්නෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය. | ආරම්භ කොට තිබේ |
| 27 | කුඩා පරිමාණයේ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම (පිටුව, 105) | 2025 වසරේ සිට වාර්ෂික වැඩසටහනක් ලෙස "නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර" පොලී සහන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය හිමි වූ අතර 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 5,503ක් වෙන් කරන ලදී. | ආරම්භ කොට තිබේ |
| 28 | දූෂණ විරෝධී කොමිසම වෙත ලැබෙන පැමිණිලි මාස හයක් ඇතුළත විමර්ශනය කිරීම හෝ එසේ නොකරන ලද පැමිණිලි පිළිබඳ වාර්තාවක් සෑම මාස හයකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පිටුව, 202) | මේ පිළිබඳ කිසිදු තොරතුරක් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට නොමැත. අදාළ ආයතන වෙත තොරතුරු දැනගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කළද ප්‍රතිචාර ලැබී නොමැත. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |
| 29 | සියලු පුරවැසියනට තම භාෂාවෙන් සේවා ලබා ගැනීමට හැකි වන පරිදි ජාතික භාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම (පිටුව, 232) | 'දිට්වා' (Ditwah) සුළි කුණාටු ව්‍යසනය අතරතුර සිදු වූ නිවේදන සම්බන්ධයෙන් තවමත් පැමිණිලි පවතී. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |
| 30 | ප්‍රතිත්‍රස්ත පනත ඇතුළු සියලු මර්දනකාරී අණපනත් අහෝසි කර සියලු ජනතාවගේ නිදහස සහතික කිරීම (පිටුව, 232) | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම වෙනුවට රජය "ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත" නමින් නව පනතක් යෝජනා කර මහජන අදහස් විමසීමට කටයුතු කොට ඇති අතර එය අපැහැදිලි තත්ත්වයක පවතී. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |
| 31 | හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර, මෙම කලාප වල නවෝත්පාදන සහ කාර්මික විවිධාංග කරණයට අනුබල දීම (පිටුව, 152) | නව ආර්ථික කලාප (උතුරු, නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවල) පිහිටුවමින් ඇති අතර ප්‍රවේශ මාර්ග, ජල සැපයුම සහ විදුලි බලය ඇතුළු මූලික යටිතල පහසුකම් සැලසීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 100ක් වෙන් කොට තිබේ. | ආරම්භ කොට තිබේ |
| 32 | සහන සහ රැකවරණය අවශ්‍ය යුද - වැන්දඹුවන්, අනාථ පුද්ගලයින්, ආබාධ සහිත ප්‍රජාව හා මානසික පීඩනයට ලක් වූවන් සඳහා සහන සැලසීම (පිටුව, 232) | ගැටුම්වලින් පීඩාවට පත් පවුල් නැවත පදිංචි කිරීමේ/ස්ථිර නිවාස ව්‍යාපෘතිය 2010 සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර 2027 දක්වා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 3500ක් වෙන් කර ඇත. | ආරම්භ කොට තිබේ |
| 33 | ශිෂ්‍යාධාර සහ මහපොළ ජීවන වියදමට සරිලන ලෙස ඉහළ දැමීම (පිටුව, 19) | විශ්වවිද්‍යාල සිසුන් 103,000කට පමණ මහපොළ සහ ශිෂ්‍යාධාර නියමිත වේලාවට ගෙවීම සඳහා 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 4600ක් වෙන් කර ඇත. | ක්‍රියාත්මක කොට තිබේ |
| 34 | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රුපියල් 10,000 ක සහනාධාර මුදලක් (පිටුව, 66) | අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා මුදල් ආධාර ලබා දීමට (පළමු කාර්තුව තුළ පවුල් මිලියන 2.05ක් සහ දෙවන කාර්තුවේ සිට පවුල් මිලියන 1.8ක්) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය 2025 වසර සඳහා ජාතික අයවැය මඟින් රුපියල් මිලියන 160,156ක් වෙන් කර ඇත. | ක්‍රියාත්මක කොට තිබේ |
| 35 | රැකියා සඳහා රට තුළ සහ රටින් පිටත සංක්‍රමණික පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම (පිටුව, 194) | විදේශගතව සිටින පුරවැසියන්ගේ ඡන්ද අයිතිය සුරැකීම සඳහා පවතින නීති සංශෝධනය කිරීම හෝ නව නීති සම්පාදනය කිරීම සම්බන්ධ කරුණු විමසා බැලීමට කමිටුවක් පත් කර ඇත. | ආරම්භ කොට තිබේ |
| 36 | එක් එක් අමාත්‍යාංශය සඳහා විෂය පිළිබඳ විශේෂඥයින්ගෙන් සමන්විත උපදේශක සභාවක් පත් කිරීම (පිටුව, 109) | මේ පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට නොමැත. අමාත්‍යාංශ 25ක් වෙත තොරතුරු දැනගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කළ අතර ප්‍රතිචාර ලැබුණේ 16ක් වෙතින් පමණි. | වැඩිදුර තහවුරු කිරීමට අවශ්‍ය වේ |

| | | | |
|---|---|---|---|
| 37 | කඳුකර දෙමළ ප්‍රජාවගේ වැටුප් ජීවන වියදමට සරිලනසේ ඉහළ දැමීම (පිටුව, 232) | කැබිනට් අනුමැතිය හිමි වූ අතර 2026 ජනවාරි සිට දෛනික වැටුප රුපියල් 400කින් ඉහළ නැංවීමට රජය සහ ප්‍රාදේශීය වතු සමාගම් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 38 | අවශ්‍යතා ඇති නිදන්ගත රෝගී පුද්ගලයන්ට අවම වශයෙන් මසකට රුපියල් 10,000ක මූල්‍යාධාරයක් ලබා දීම (පිටුව, 67) | ආබාධ සහිත තැනැත්තන්, හේතුව හඳුනාගත නොහැකි නිදන්ගත වකුගඩු රෝගයෙන් (CKDu) පෙළෙන රෝගීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන දීමනා ගෙවන කාලසීමාව 2025 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට කැබිනට් අනුමැතිය හිමි වූ අතර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරන ලදී. | ක්‍රියාත්මක කොට තිබේ |
| 39 | මූල්‍ය දුෂ්කරතා ඇති වැඩිහිටියන් සඳහා මූල්‍ය දීමනාවක් (පිටුව, 92) | අස්වැසුම යෝජනා ක්‍රමයේ ii වන උපලේඛනය යටතේ රුපියල් 7,500 සිට 10,000 දක්වා ගෙවීම් වැඩි කිරීම සහ වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට 5,000 දක්වා 2025 අප්‍රේල් සිට වැඩි කිරීමට කැබිනට් අනුමැතිය සහ අයවැය ප්‍රතිපාදන හිමි විය. | ක්‍රියාත්මක කොට තිබේ |
| 40 | අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා රුපියල් 10,000ක මාසික මූල්‍යාධාරයක් (පිටුව, 66) | අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ උපලේඛනය යටතේ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ලබා දෙන මාසික දීමනාව වැඩි කිරීමට කැබිනට් අනුමැතිය සහ අයවැය ප්‍රතිපාදන හිමි විය. | ක්‍රියාත්මක කොට තිබේ |

## දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත සන්දර්භය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ආපදා කළමනාකරණය පිළිබඳ වෙන් වූ තේමාත්මක කොටසක් ඇතුළත්ව නැත. කෙසේ වුවද, ආපදා ආශ්‍රිත කැපවීම් 13ක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විවිධ තේමාත්මක ක්ෂේත්‍ර පුරා විසිරී පවතී. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුවක් ලෙස පිළිගත් පසු, ආපදා ආශ්‍රිත කැපවීම් 10ක් තනි තේමාත්මක කාණ්ඩයක් යටතේ ඒකාබද්ධ කරන ලදී. පස්වාත් දිට්වා සුළි කුණාටු සන්දර්භය තුළ, විශේෂයෙන් මුදාගැනීමේ, සහන සැලසීමේ සහ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් ආපදා කළමනාකරණය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ තීරණාත්මක අංගයක් බවට පත් වී ඇත.

රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට අමතරව, 2026 පරිපූරක ඇස්තමේන්තුවක් හරහා මූල්‍ය කැපවීම් ද වෙන් කර ඇත. 2025 දෙසැම්බර් 19 වන දින, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ විනාශයෙන් අනතුරුව යථාවත් වීමේ කටයුතු සඳහා රුපියල් බිලියන 500ක (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.6ක්) පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන අනුමත කරන ලදී. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්, අලුතින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති පියවර, හදිසි ගැසට් නිවේදන, මහා භාණ්ඩාගාර චක්‍රලේඛ, කැබිනට් තීරණ සහ "ශ්‍රී ලංකාව යළි ගොඩනැගීමේ අරමුදල" (Rebulding Sri Lanka Fund) හරහා රැස් කරන ලද අරමුදල් යන සියල්ලේ එකතුව, ආපදා කළමනාකරණය සහ යථාවත් වීමේ උත්සාහයන් අක්ෂණය කිරීම සඳහා අමතර සහ සමාන්තර මාර්ගයක් නිර්මාණය කොට තිබේ.

රජයට 2029 දක්වා මැතිවරණයකින් ලද ජනවරමක් පවතින බැවින්, ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අඛණ්ඩ සහ විධිමත් අධීක්ෂණයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. අඛණ්ඩ අධීක්ෂණය මගින් වගවීම සහතික කිරීමටත්, ප්‍රගතිය ලුහුබැඳීමටත් හැකි වනු ඇති අතර, ප්‍රතිපත්තිමය කැපවීම් පුරවැසියන් සඳහා ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල බවට පරිවර්තනය වන ප්‍රමාණය තක්සේරු කිරීමට අවස්ථාව සැලසෙනු ඇත.

---

PAFFREL
March 12 Movement

**නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)**
**මාර්තු 12 ව්‍යාපාරය**
නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06
+94 11 255 8570ඌ71
paffrel@sltnet.lk

Scan to view Full Report